# පෙරවදන

ආධුනික ගුවන්විදුලි ශිල්පය පාඨමාලාවේ ආරම්භය පිළිබඳ ඉතිහාසය දැනගැණීම කාහටත් ප්‍රයෝජනවත් වියහැකිය. එබැවින් එය මෙසේ ඉදිරිපත් කරමි.

1981 වසර ලෝක ආබාධිත වර්ෂය ලෙස ප්‍රකාශවීමත් සමග එවකට **"**ශ්‍රී ලංකා ආධුනික ගුවන්විදුලි සංගමයේ**"** (Radio Society of Sri Lanka) සභාපතිත්වය දැරූ ජෝන් ඊ් අමරතුංග මහතා (4S7JA) දෘශ්‍යාබාධිතයින් සඳහා ආධුනික ගුවන්විදුලි ශිල්පය පිළිබඳ පාඨමාලාවක් ආරම්භ කරන ලදී. එවකට සංගමයේ ලේකම් ධුරය හෙබවූ කේ.කේ.ජී.කුලසේකර මහතාගේ (4S7KG) පූර්ණ සහභාගීත්වය සහිතව රත්මලාන අන්ධවිද්‍යාලයෙහි ආරම්භවූ මෙම පාඨමාලාවට රත්නපුර ගිලීමලේ ඕ.වී.ධර්මසේන මහතා (පූර්ණ දෘශ්‍යාබාධිත) සහ තවත් කීපදෙනෙක් සිසුන් ලෙස සහභාගි විය. වසර දහයකට පසු විභාගයට පෙනීසිට සුදුසුකම් ලැබූ ධර්මසේන මහතා, ශ්‍රී ලංකාවේ ප්‍රථම දෘශ්‍යාබාධිත බලපත්‍ර ලාභියා බවට පත්විය. ඔහුගේ සංඥානාමය 4S7OV වේ. පසු කලෙක අමරතුංග මහතා සහ කුලසේකර මහතාගේ වැඩපිළිවෙලට මමද සහභාගී වූ අතර අමරතුංග මහතාගේ අභාවයෙන් පසු කුලසේකර මහතා සහ මම එය ඉදිරියට ගෙන ගියෙමු.

මෙහිදී සතියකට වරක් පැවැත්වූ සෑම පන්තියක් සඳහාම මා ඉංග්‍රීසියෙන් පිළියෙල කරනලද සටහන් මාගේ පරිගණකයේ එක්රැස්වූ අතර පසු කලෙක ඒවා පරිච්ඡේද අටක් ලෙස සංස්කරනය කළෙමි. දෘශ්‍යාබාධිතයින් සඳහාවූ පන්ති, ඔවුන්ගේ සහ රත්මලාන අන්ධ විද්‍යාලයේ අලසභාවය හේතුකොටගෙන අභාවයට පත්වූ අතර ශ්‍රී ලංකා ආධුනික ගුවන්විදුලි සංගමයේ සාමාජිකයින් සඳහා තවදුරටත් එය කරගෙන යමි. නවක සිසුන් ගණනාවකගේ ඉල්ලීම පරිදි මෙම පාඨමාලාව සිංහලට පරිවර්තනය කළෙමි. සිංහල පාඨමාලාව වඩාත් ඵලදායී ලෙස තවදුරටත් සංස්කරනය කළෙමි.

ජේ.ටී.විජේරත්න - 4S7VJ